අල් කුර්ආනයේ අති වැදගත් සූරාවක් මම ඔබට කියා දිය යුතු නොවේද?

අබූ සඊද් රාෆිඃ ඉබ්නු අල් මුඃලී-රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණෝ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- මට මෙසේ පවසා සිටියහ. “ඔබ මස්ජිදයෙන් පිටව යන්නට මත්තෙන් අල් කුර්ආනයේ අති වැදගත් සූරාවක් මම ඔබට කියා දිය යුතු නොවෙම්ද?“ පසුව මාගේ අත අල්ලා ගත්තේය. අපි පිටව යන්නට සිතූ කල්හි, “අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! අල් කුර්ආනයේ ඇති අති මහත් සූරාව සැබැවින්ම මම ඔබට කියා දෙන්නදැ?යි ඔබ පැවසුවෙහිය“ යැයි ඇසුවෙමි. එතුමා: අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන් වේ. එය සබඃ මසානී හෙවත් නැවත නැවතත් කියවෙන වැකි හතකින් සමන්විත වූවකි. එමෙන්ම එය මට පිරිනමනු ලැබූ අති මහත් කුර්ආනය වේ. යැයි පැවසුහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

අබූ සඊද් රාෆිඃ ඉබ්නු අල් මුඃලී-රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණෝ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- මට මෙසේ පවසා සිටියහ. “අලා“ යන පදය මින් පසුව ඇති පද පෙළ කතා කරනු ලබන්නාට අවධාරණය කරනු වස් සඳහන් ප්රකාශයකි. “ඔබ මස්ජිදයෙන් පිටව යන්නට මත්තෙන් අල් කුර්ආනයේ අති වැදගත් සූරාවක් මම ඔබට කියා දෙන්නද?“ එසේ එතුමා පවසා සිටියේ, ඔහු ඒ ගැන ආරම්භයක් නොදන්නා බැවින් හා ඔහුගේ බුද්ධියට වැටහෙන හා එය සම්පූර්ණව පිළිගැනීමට හැකිවන අයුරින් සිදුකරන ඇරයුමක් ලෙසිනි. ‘පසුව මාගේ අත අල්ලා ගත්තේය.‘ එය එතුමාණන් එසේ පවසා අපි ගමන් ගත් පසුවය. අපි පිටව යන්නට සිතූ කල්හි, “අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! අල් කුර්ආනයේ ඇති අති මහත් සූරාව සැබැවින්ම මම ඔබට කියා දෙන්නදැ?යි ඔබ පැවසුවෙහිය“ යැයි ඇසුවෙමි. එතුමා, “අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන් වේ. එනම් සූරතුල් ෆාතිහාය“ යැයි පැවසූහ. එය අතිමහත් සූරාවක් වන්නට හේතුව අල්කුර්ආනයේ ඇති සියලු අරමුණු තමන් සතුකර ගෙන තිබෙන බැවිනි. එහෙයින් එයට උම්මුල් කුර්ආන් (කුර්ආනයේ මව) යැයි නම් කරන ලදී. සෙසු සූරාවන්ට වඩා මෙම සූරාවෙහි වැදගත් කම වෙන්කර පෙන්වනු වස් එය (සබඃ මසානී) හෙවත් නැවත නැවතත් කියවෙන වැකි හතකින් සමන්විත වූවක් යැයි පවසා එය සංකේතවත් කළහ. එනම්, එසේ නම්කරනු ලැබුවේ, ද්විත්වය යන තේරුම ගෙන දෙන තස්නියා නම් අරාබි පදයෙන් මුසන්නාත් යන බහු පදය භාවිත කරමින් විය හැක. හේතුව සෑම සලාතයකම දෙක දෙක බැගින් බහුවාර ගණනක් පවසන බැවිනි. එසේ නැතිනම් සෙසු සූරාවන් මෙන් නොව දෙවතාවක් බැගින් කියවන බැවිනි. එසේත් නැත්නම් ප්රශංසාව හා ප්රාර්ථනාව යන කොටස් දෙක එහි අන්තර්ගතව ඇති බැවිනි. එසේත් නැතිනම් එහි ගොඩ නැගී ඇති වාග්ශෛයලය හා එහි අර්ථයේ වාග්චාතුර්යය යන කරුණු දෙක හේතුවෙනි. එසේත් නැතිනම් කාලය ගෙවී ගිය ද එය නැවත නැවතත් කියවනු ලබන බැවිනි. එය නිරතුරුව නැවත නැවතත් කියවනු ලබන්නක් මෙන්ම එය හදාරන්නේ නැතිවම හදාරන්නක් වෙයි. එසේත් නැතිනම් එහි ඇති ප්රයෝජන අවස්ථාවෙන් අවස්ථාවට අලුත්වන බැවිනි. එයට අවසානයක් නැත. ප්රශංසාව යන අර්ථය ගෙන දෙන සනාඋ යන පදයෙන් බිහි වූ මුසන්නාහ් යන බහු වචනයෙන් ද එහි අර්ථය විය හැක. හේතුව මෙහි අල්ලාහ්ගේ පැසසුම අන්තර්ගතව ඇති බැවිනි. එමෙන්ම අල්ලාහ්ගේ අලංකාර නාමයන් හා ඔහුගේ ගුණාංග ගුණගායනා කරන්නක් මෙන් මෙය පවතින බැවිනි. එසේත් නැතිනම් වෙන්කිරීම යන අර්ථය ගෙන දෙන සනායා යන පදයෙන් අර්ථවත් විය හැක. හේතුව අල්ලාහ් මෙම සමූහය වෙනුවෙන් එය වෙන්කර දී ඇති බැවිනි. මේ හැර වෙනත් දෙයක් ද විය හැක. අතිමහත් කුර්ආනය යන පදය වනාහි එසේ එය තවදුරටත් වර්ණනා කර ඇත්තේද මේ හේතූන් මතය. එය මට දෙනු

ලැබීය. එනම් එය මට දෙනු ලැබීයක් විය. එය අතිමහත් අල් කුර්ආනය යනුවෙන් නම් කර ඇත්තේ මෙලොව හා මතුලොව ඇති සියල්ල අන්තර්ගතවූ නීති හා සංකල්ප යන සියල්ල එක්ව ඇති බැවිනි.

http://sunnah.global/hadeeth/si/show/10112